**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය - 2019**

---

## 1.1. තත්ත්වාගණනය කළ මතය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට ( ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ ප්‍රමිත

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් තවමත් භාවිතා කරනු ලබන පිරිවැය රු.160,515,223 ක් වූ ස්ථාවර වත්කම් පිළිබඳව ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 07 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | අදාළ හෙළිදරව් කිරීම 2020 ගිණුම් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරිමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | වත්කම් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට |

### 1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | | |
| (අ) | ජංගම නොවන වත්කම් | 128,302,963 | 129,694,533 | 1,391,570 | සමහර වත්කම් කාණ්ඩගත කිරිමේදී මූල්‍ය ප්‍රකාශන වල සඳහන් කර ඇති වත්කම් වර්ගය උපලේඛන වල සටහන් කර ඇති වත්කම් වර්ගය හා වෙනස් වන බැවින් අදාළ වත්කම් කාණ්ඩ වල වෙනස්කම් ඇති බව කාරුණිකව දන්වා සිටිමි.උදා. ලෙස මූල්‍ය | මූල්‍ය ප්‍රකාශන වලින් නිවැරදි කිරීමට |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | ප්‍රකාශන වල ලී බඩු ලෙස වත්කම් වර්ග කර ඇති අයිතමයක් උපලේඛනයේ කාර්යාල උපකරණ ලෙස සටහන් කර තිබීම. සමහර වත්කම් වර්ග උපලේඛන සමඟ ගළපා ද්විත්ව සටහන් මඟින් මෙම වසරේ නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. නමුත් මූල්‍ය ප්‍රකාශන වල හා වත්කම් උපලේඛනයේ තවදුරටත් පවතින වෙනස්කම් නිවැරදි කිරීම සඳහා සියලු වත්කම් ප්‍රත්‍යාගණනය කර අදාළ වෙනස්කම් නිවැරදි කිරීමේ කටයුතු පවතින වසංගත තත්වය හේතුවෙන් ප්‍රමාද වී ඇත. | |
| (ආ) | ලැබියයුතු, ආපදා ණය හා උත්සව අත්තිකාරම් | 7,984,983 | 7,972,548 | 12,435 | ශේෂ පත්‍රයේ ණය ගැති ශේෂය හා ලැයිස්තු අතර 12,435/- ක වෙනසක් තිබූ අතර මෙය ඉහතදී විශාල වටිනාකමින් යුතු ශේෂ වෙනසක් ලෙස පැවතියද පසුව කරන ලද පරීක්ෂණ වලින් ඉහත වටිනාකම දක්වා අඩුකර ගැනීමට හැකි විය. නමුත් ලිපිලේඛන සොයා ගැනීමට ඇති අපහසුව මත මෙය තවදුරටත් පරීක්‍ෂා කිරීමට නොහැකි වී ඇති අතර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම | මූල්‍ය ප්‍රකාශන වලින් නිවැරදි කිරීමට |

සඳහා භාණ්ඩාගාරයේ උපදෙස් ලබා ගැනීමට 2018.12.27 පැවති විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදී ද තීරණය විය. ඒ අනුව NDDCB/FIN/MIN/2019/11 දරණ 2019.07.03 දිනැති ලිපිය මඟින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අමතා මෙම දෝෂ නිවැරදි කිරීම සම්බන්ධව උපදෙස් ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර ඇති අතර ආරක්ෂක අමාත්‍යාංශය මඟින් ඉදිරි කටයුතු සඳහා මෙම ලිපිය 2019.08.22 දිනැතිව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට යොමු කර ඇත. නමුත් මේ දක්වා උපදෙස් ලැබී නොමැතිබැවින් නැවත පසු විපරම් කිරීමේ කටයුතු මේ වන විට සිදු කරනු ලබයි.

### 1.5.3 අවිනිශ්චිත ගිණුම්

| විෂය | මුදල | අවිනිශ්චිත ලෙස තිබූ කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අවිනිශ්චිත ගිණුම | රු. 480,900 | වසර 6 | විගණනයෙන් පෙන්වා දී ඇති ශේෂය 2014 වර්ෂයේ දී සිදු කරන ලද ගිණුම්ය ගැළපීමක් තුළින් පැන නැඟෙන ලද ශේෂයකි. මෙය නිරවුල් කිරීම සඳහා අදාළ සියළුම ගිණුම් පරීක්ෂා කරමින් පවතින අතර මේ වන තෙක් සොයා ගත නොහැකි වී ඇත. ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා භාණ්ඩාගාරයේ උපදෙස් ලබා ගැනීමට 2018.12.27 පැවති විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදී ද තීරණය විය. ඒ අනුව NDDCB/FIN/MIN/2019/11 දරණ 2019.07.03 දිනැති ලිපිය මඟින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අමතා මෙම දෝෂ නිවැරදි කිරීම සම්බන්ධව උපදෙස් ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර ඇති අතර ආරක්ෂක අමාත්‍යාංශය මඟින් ඉදිරි කටයුතු සඳහා මෙම ලිපිය 2019.08.22 දිනැතිව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට යොමු කර ඇත. නමුත් මේ දක්වා උපදෙස් ලැබී නොමැති බැවින් මණ්ඩලය විසින් නැවත පසු විපරම් කර නැවත විමසීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.1,782,059 ක් වූ අත්තිකාරම් ශේෂයන් වසර 20 කට වඩා වැඩි කාලයක සිට අයකර ගැනීමෙන් තොරව පැවති අතර එම ශේෂය සනාථ කර ගැනීම සඳහා සඳහා වන ශේෂ සනාථන ලිපි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | මෙම අත්තිකාරම් ශේෂය NDDCB/FIN/MIN/2019/11 දරණ 2019.07.03 දිනැති ලිපිය මඟින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අමතා මෙම දෝෂ නිවැරදි කිරීම සම්බන්ධව උපදෙස් ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර ඇති අතර ආරක්ෂක අමාත්‍යාංශය මඟින් ඉදිරි කටයුතු සඳහා මෙම ලිපිය 2019.08.22 | නිශ්චිතව හඳුනා ගෙන නිරවුල් කිරීමට |

දිනැතිව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට යොමු කර ඇත. නමුත් මේ දක්වා උපදෙස් ලැබී නොමැති බැවින් මේ වන විට පසු විපරම් කර බැලීමේ කටයුතු සිදු කරනු ලැබේ.

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්තාපනය) පිළිබඳ පනත 7 වගන්තිය | මෙකී වගන්තිය ප්‍රකාරව තුලනීක්ෂණ මූල මණ්ඩල පත්කර නොතිබුණි. | 2007 අංක 54 දරණ ඖෂධ වලට ඇබ්බැහි තැනැත්තන් පුනරුත්ථාපනය පිළිබඳ පනතේ 7 (1) වගන්තිය යටතේ තුලනීක්ෂණ මූල මණ්ඩල පත් කරනු ලැබිය යුත්තේ අමාත්‍යාවරයා විසිනි. එසේ හෙයින් ඒ පිළිබඳ ඍජු මැදිහත්වීමේ හැකියාවක් මෙම මණ්ඩලයට නොමැති බව කාරුණිකව පෙන්වා දෙමි.<br><br>කෙසේ වෙතත් පනතේ 7 (2) වගන්තිය යටතේ පත් කල යුතු තුන්දෙනෙකුට නොවැඩි තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් නම් කල යුතු තුලනීක්ෂණ මූලමණ්ඩලය වෙත අදාළ පනත මගින් හා අංක 1653/19 දරණ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පවරා ඇති කාර්යයන් මෙම මණ්ඩලයේ විමර්ශන නිලධාරීන් තිදෙනෙක් මගින් ආවරණය කර අධ්‍යක්ෂ (නමෝදිෂ්ය ප්‍රතිකාර මධ්‍යස්ථාන) මගින් මණ්ඩලයට වාර්තා කරන බවත් මෙම පනත මේ වන විටත් අදාල සංශෝධන | මත්ද්‍රව්‍ය භාවිතා කරන පුද්ගලයන් සඳහා හොඳ ප්‍රතිකාර සැලැස්මක් ඇති කිරීමට |

| | | | |
|---|---|---|---|
| | | කරමින් පවතින බවත්, කාරුණිකව දන්වා සිටිමි. | |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 753 (2) | මහනුවර ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ භාණ්ඩ ලැබීම් සම්බන්ධ භාණ්ඩ ලැබීම් පත්‍රිකා ගොනුගත කර නොතිබීම හේතුවෙන් ලද සියළු භාණ්ඩ ලැබීම් ලේඛණගත වුයේද යන්න තහවුරු කර ගත නොහැකි විය. | ඉදිරියට නිවැරදිව කටයුතු කරන ලෙසට කාර්ය මණ්ඩලය දැනුවත් කරන ලදී. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීමට |
| (ii) මුදල් රෙගුලාසි 754 | සෑම මුදල් වර්ෂයකම අවසානයේදී බඩු ලේඛන පොත තුලනය කල යුතුය. එසේම ඒ ඒ භාණ්ඩ වර්ගය සම්බන්ධයෙන් වූ ලැබීම් හා නිකුත් කිරීම් එකතු කළයුතු අතර,ඉන්පසුව ඒ ඒ භාණ්ඩ වර්ගය සම්බන්ධයෙන් "අතේ ඇති ශේෂය " එනම් ලැබීම් එකතුව හා නිකුත් කිරීම් එකතුව අතර වෙනස නිකුත් කිරීම් යටින් ලියා ඊට එකතු කර දක්වා එම ශේෂය ඊළඟ මුදල් වර්ෂයට ගෙන යා යුතු වුවත් මහනුවර ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය එසේ කර නොතිබුණි. | ඉදිරියේදී විගණන නිර්දේශ පරිදි කටයුතු සිදුකිරීම. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීමට |
| (ඇ) 2009 අප්‍රේල් 04 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009, 2009 ජුනි 17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009(I)සහ 2017 අප්‍රේල් 19 දිනැති රාජ්‍ය | 2016 වර්ෂයේ ගාල්ල ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ සවිකරන ලද ඇඟිලි සලකුණු යන්ත්‍රයෙහි ඇඟිලි සලකුණු නිවැරදි බවට සංඥා නිකුත් කිරීම සිදු වුවත් යන්ත්‍රයෙන් නිකුත් කරනු ලබන දත්ත පිළිබඳ වාර්තාවන් පරිගණකය තුලින් ලබාගත නොහැකි වී තිබුණි. | එම දෝෂ කඩිනමින් පිළිසකර කර ඇඟිලි සලකුණු යන්ත්‍රය යාවත්කාලීන කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන බව. | චක්‍රලේඛය අනුව කටයුතු කිරීමට |

| | | | |
|---|---|---|---|
| පරිපාලන චක්‍රලේඛ අංක 03/2017 | | | |
| (ඇ)2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| (i) 5.2.1 (අ) වගන්තිය | වානේ අල්මාරි 12ක් හා වානේ කබඩ් 12ක් මිලදී ගැනීම සඳහා ලංසු භාර ගැනීමේ දිනට පසුව ලැබුණු ලංසුද භාරගෙන ඇගයීම් කර තිබුණි. | අදාල ලිපි බෙදා හැරීමේ වූ ප්‍රමාද දෝෂයක් සිදු වී ඇති අතර ඉදිරියේදී එවැනි ප්‍රමාදයන් ඇති නොවන පරිදි කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීම |
| (ii) 7.8.4 (ඇ) වගන්තිය | ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවල භාවිතය සඳහා පොත් රාක්ක සහ වානේ අල්මාරි 12ක් මිලදී ගැනීමට මිල කැඳවීම් කරන ලද ලංසුවල ලංසුකරුවන් විසින් අත්සන් නොකරන ලද ලංසු, විශාල බැහැරවීම් ලෙස සලකා පිළිගත නොහැකි වුවද මණ්ඩලය විසින් අත්සන් නොකරන ලද ලංසු ඇගයීම සඳහා භාජනය කර තිබුණි. | මෙය අතපසුවීමකින් සිදුවී ඇත. ඉදිරියේදී මෙවැනි දෝෂ මඟ හරවා ගැනීමට කටයුතු කරනු ලැබේ. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීම |
| (iii) 8.12.3 (අ) වගන්තිය | තලංගම ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය සඳහා පොත් රාක්ක ඉල්ලීම් කර තිබුණද ඒවායේ වර්ගය, ප්‍රමාණය, උස, දිග, පළල ආදිය ගැන සඳහන් පිරිවිතර ඉදිරිපත් කර නොතිබුණි. | පුස්තකාලය සඳහා සකස් කල පිරිවිතරයන්ට අනුව දුරකථනයෙන් මධ්‍යස්ථානයේ කළමනාකරු හා සාකච්ඡා කිරීමෙන් ලබා ගෙන ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීම |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 38,259,644 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.28,291,721 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,967,923ක ඌනතාවයේ වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අනෙකුත් මෙහෙයුම් වියදම් රු.4,294,124 කින් වැඩිවීම සහ පෞද්ගලික හා පරිපාලන වියදම් රු.11,160,824 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නවදිගන්තය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ වෘත්තිය පුහුණු අංශ ගොඩනැගිල්ලේ වහලය අළුත්වැඩියාව වසර 4 ක කාලයක් තිස්සේ සිදුකර නොතිබුණි. මණ්ඩලයේ මෙම අළුත්වැඩියා කටයුතු සම්බන්ධව පියවර නොගැනීම හේතුවෙන් අධික මිලක් ගෙවා ලබා ගත් යන්ත්‍ර සූත්‍ර සහ ඒ සම්බන්ධ පුහුණුව ලබන සේවාලාභීන්ගේ ජීවිත සම්බන්ධයෙන්ද දැඩි අවදානමක් පැවතුණි. | වෘත්තිය පුහුණු අංශයේ වහලය අලුත්වැඩියා කිරිම සිදුවෙමින් පවතී. | කඩිනමින් පිළිසකර කිරීමට කටයුතු කිරීමට |
| (ආ) මහනුවර, නවදිගන්තය හා ගාල්ල ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවල රු.612,000 වියදම් කර මිලදී ගන්නා ලද CCTV කැමරා පද්ධති ක්‍රියාත්මක නොවන අතර මධ්‍යස්ථානවල ආරක්ෂාව සම්බන්ධයෙන් අත්‍යාවශ්‍ය වූ මෙම CCTV කැමරා පද්ධති අලුත්වැඩියා කිරීමට හෝ නව උපකරණයක් සවි කිරීමට මණ්ඩලය පියවර ගෙන නොතිබුණි. | මෙම කාර්ය ඉටු කිරීමට නොහැකි වී ඇත්තේ මණ්ඩලයට ලැබෙන ප්‍රතිපාදනවල ප්‍රමාණවත්භාවය අඩුවීම මතය. | නිවැරදි පිරිවිතරයන්ට අනුව මිලදී ගැනිම් සිදු කිරීමට |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලයේ විද්‍යාගාරය තුල පරීක්ෂණ කටයුතු සඳහා භාවිතා කිරීම පිණිස විවිධ ආයතනවලින් මණ්ඩලයට ලබාදී තිබුණු වර්ග 12 කට අයත් අන්තරායකර මත්ද්‍රව්‍ය පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | රසායනාගාරය තුල පවතින විමසුමෙහි සඳහන් වන මත්ද්‍රව්‍ය විශ්ලේෂණ කටයුතු සඳහා අදාල ආයතන විසින් රසායනාගාරය වෙත යොමු කර ඇති අතර, එම සාම්පල ලබා දීමේදී එසේ ලබා දෙන පාර්ශවයන් විසින් කිසිදු වටිනාකමක් නියමකර රසායනාගාරයට එම මත්ද්‍රව්‍ය ලබා නොදේ.<br>එමෙන්ම මත්ද්‍රව්‍ය සම්බධයෙන් කිසිදු පනතකින් ආවරණය නොවන අතර, බර ප්‍රමාණය මත දණ්ඩනයකට සහ දඩයකට යටත් කර ඇත .<br>උදා;- දරන විෂ අබිං සහ 13 අංක 1984 ආඥා (සංශෝධිත) අන්තරායකර ඖෂධ පනත<br>තවද, මෙම මත්ද්‍රව්‍ය වටිනාකම යන්න හුදෙක්ම එය භාවිතා කරන්නන් හට වෙළඳුන් විසින් නිර්මාණය කර ඇති නීති ගත නොවූ මිල ගණන් වන අතර, එලෙස මිල ගණන් තක්සේරු කිරීමේදි තක්සේරු වටිනාකමක් ද දැක්විය නොහැකි ද්‍රව්‍යන් වේ.<br>එබැවින්, අදාල මත්ද්‍රව්‍ය තොගයේ වටිනාකම තක්සේරු කර ගත නොහැකි බව කාරුණිකව දැනුම් දීමට කැමැත්තෙමි.<br>තවද, එම මත්ද්‍රව්‍ය මූල්‍ය ප්‍රකාශන තුල එහි වටිනාකමක් සඳහන් කර නොහැක්කේ මෙහි නීතිමය රාමුවක් නොමැති බව මත වේ. | වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමට |
| (ආ)දිර්ඝ කාලයක් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ පුද්ගලයන් නැවත නැවත ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙහි සේවා ලබා ගැනීමේ ප්‍රවණතාවය අදාල මධ්‍යස්ථානවල ලිපිගොනු පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර, නවදිගන්තය ප්‍රතිකාර හා පුනරුත්ථාපන | සේවාලාභීන්ගේ හා භාරකරුවන්ගේ කැපවීම මත තීරණය වේ. | පසු විපරම් ක්‍රියාවලිය නිසි ආකාරව ඉටුකිරීම |

| | | |
|---|---|---|
| මධ්‍යස්ථානයේ මාස 2 ක හෝ 3 ක ප්‍රතිකාර කාලයක් අවසන් කළ සේවාලාභීන් වසරක් වැනි කාලයක් ඇතුලත නැවත මධ්‍යස්ථානය වෙත ප්‍රතිකාර සඳහා පැමිණීම නිරීක්ෂණය විය. අවශ්‍ය පසු විපරම් ක්‍රියාවලිය නිසි ආකාරව ක්‍රියාත්මක නොවීම මීට හේතු වී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. | | |
| (ඇ) කල් ඉකුත් වූ රු.210,883 ක් වටිනා රසායන ද්‍රව්‍ය වර්ග 12 ක් වර්ෂ දෙකක කාලයක සිට නියමිත පරිදි බැහැර කිරීමට කටයුතු කර නොතිබුණි. | එම රසායන ද්‍රව්‍ය තොගය, සමීක්ෂණ කමිටුව විසින් විනාශ කළ යුතු බව හඳුනා ගෙන ඇත. | කල් ඉකුත් වූ තොග ගබඩාවෙන් ඉවත් කිරීමට. |
| (ඇ) මත්ද්‍රව්‍ය භාවිතයෙහි ව්‍යාප්තිය සහ නූතන ප්‍රවණතා පිළිබඳ අධ්‍යනය 2016/2017 පර්යේෂණ වාර්තාව ප්‍රකාරව මත්ද්‍රව්‍ය භාවිතා කරන වයස් කාණ්ඩ,වයස 14 ට අඩු සියයට 13ක්, වයස 15 – 19 ත් අතර සියයට 16 ක් හා වයස 20 – 24 ත් අතර සියයට 19 ක් නියෝජනය වන බව අනාවරණය කර තිබුණි. මෙහිදී පුද්ගලයකුගේ මුල් භාවිත වයස, එනම් අත්හදා බැලීමක් වශයෙන් එනම් කුතුහලය, ගැටලු අවස්ථාවලදී, මිතුරු බලපෑම, සතුට විනෝදය නිසා මුලින්ම භාවිතා කරන වයස නව යොවුන් විය හෝ ඊට පසු කාලය ලෙස සඳහන් කර තිබුණි. මේ අනුව මත්ද්‍රව්‍ය නිවාරක, පුහුණු හා අධ්‍යාපනික වැඩසටහන් හි සැළකිය යුතු ප්‍රතිශතයක් පාසල් ළමුන් ඉලක්ක කරගෙන සිදු විය යුතු වුවත් ශ්‍රී ලංකාවේ 10,000 කට අධික වූ පාසල් සංඛ්‍යාවෙන් 2013 | නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් පාසල් සිසුන් අවධානම් චර්යා සඳහා පොළඹවන මනෝවිද්‍යාත්මක සාධක වෙත ආමන්ත්‍රණය කරමින් මත් ද්‍රව්‍ය භාවිතය අවම කිරීම උදෙසා සාක්ෂි මත පදනම් වූ විද්‍යාත්මක සහ ගුණාත්මක වැඩසටහන් දියත්කරනු ලැබේ.<br>2013 වර්ෂයේ අංශය සතු මානව හා භෞතික සම්පතෙහි වූ හිඟය මත වැඩසටහන්137 තුළින් සිසුන් 21,605 පමණක් ආමන්ත්‍රණය කිරීමට හැකියා ව ලැබී ඇත. ඉන් පසු 2014 වර්ෂයේ දෙවන කාර්තුවේ සිට සැළකිය යුතු මානව සම්පතක් අංශය සතු වූ අතර වැඩසටහන් වල ක්‍රමික වර්ධනයක් ද පෙන්නුම් කර ඇත. 2018 වර්ෂයේ දී වාර්ෂිකව සිදු කිරීමට නියමිතව තිබූ වැඩසටහන් 500 ඉලක්කය අභිබවා පාසල් වැඩසටහන් 670 ක්‍රියාත්මක කිරීමට ද නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයට හැකියාව ලැබුණි.<br>එහෙත් 2019 වර්ෂයේ ඉලක්ක ගත වැඩසටහන් සංඛ්‍යාව වෙත ළඟාවීමට නොහැකි විය. පාස්කු දින ප්‍රහාරයෙන් පසු සැළකිය යුතු කාලයක් පාසල් වසා තිබීමත්, ආරක්ෂක හේතු මත බාහිර පුද්ගලයින්ට සහ ආයතන වලට පාසලට ඇතුල්වීමට ඉඩ නොලැබීමත් හේතුවෙන් | මත්ද්‍රව්‍ය නිවාරක, පුහුණු හා අධ්‍යාපනික වැඩසටහන් වයස් කාණ්ඩවලට බෙදා වැඩිපුර පාසල් ළමුන් ඉලක්ක කරගෙන සිදු කිරීම |

වර්ෂයේ සිට 2019දෙසැම්බර් දක්වා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණු පාසල් සංඛ්‍යාව 3109 ක එනම්, සියයට 30 ක පාසල් ප්‍රමාණයක පමණි.

වැඩසටහන් සංඛ්‍යාව පහළ බසින ලදී. එමෙන්ම පාසල් විෂය නිර්දේශ ආවරණය කිරීමට පාසල් කාලය අවශ්‍ය වූ බැවින් වැඩසටහන් සඳහා පාසලෙන් ලබාදුන් අවකාශය ද අවම විය.

එහෙත් 2015 සිට 2018 දක්වා කාලවකවානුව තුළ වාර්ෂික ඉලක්කයන් අභිභවා යෑමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත් විය.

(ඊට අදාළ සංඛ්‍යා දත්ත පහතින් දක්වා ඇත)

2013 වර්ෂයේ සිට 2019 වර්ෂය තෙක් නිවාරක හා අධ්‍යාපන අංශය මඟින් පවත්වන ලද පාසල් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ප්‍රමාණය සහ සහභාගී වූවන්ගේ ප්‍රමාණය. (මණ්ඩලයේ වාර්ෂික වාර්තාවන්ට අනුව)

| | වර්ෂය | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ ළමුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | 2013 | 137 | 21,605 |
| 02 | 2014 | 315 | 70,330 |
| 03 | 2015 | 564 | 99,950 |
| 04 | 2016 | 607 | 120,876 |
| 05 | 2017 | 614 | 126,456 |
| 06 | 2018 | 670 | 121,536 |
| 07 | 2019 | 390 | 79,863 |

එහෙත් දීප ව්‍යාප්තව පවතින 10000 කට අධික පාසල් සංඛ්‍යාව ආවරණය කිරීමට අවශ්‍ය මානව සම්පත අප අංශය සතු නොවන බැවින් එම ඉලක්කය කරා ළඟා වීමට නොහැකි වී ඇත. එහෙත්, පාසල් ගුරුවරුන් සහ රේඛීය ආයතන වල නිළධාරීන් පුහුණු කරුවන් ලෙස පුහුණු කිරීමේ වැඩසටහන් ඔස්සේ එම තත්වයට යම්තාක් සාර්ථක පිළිතුරක් ලබාදීමට හැකිවී ඇත. පවතින මානව සම්පත දීපව්‍යාප්තව අංශ 16 ඔස්සේම යොදවා ඇති බැවින් ප්‍රායෝගිකව උක්ත ඉලක්කයට ළඟාවීමට අපහසු වූ බවද සඳහන් කරමු.

| | | |
|---|---|---|
| (ඉ)මත්ද්‍රව්‍ය අලෙවි සහ ජාවාරම් කිරීම් සම්බන්ධව සැළකීමේදී කාන්තාවන් ඊට යොමු වීමේ ප්‍රවණතාව ඉහළ මට්ටමක පවතින බැවින් කාන්තාවන් අලෙවිය සම්බන්ධයෙන් දක්වන දායකත්වය අවම කර ගැනීමට කාන්තාවන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වුවත් කාන්තාවන් ඉලක්ක කර ගෙන සිදු කරන ලද නිවාරක අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් පසුගිය වර්ෂ 5 තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. | ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත නීතිය සහ ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූලව මත්ද්‍රව්‍ය දුර්භාවිත ව්‍යාප්තිය අවම කිරීම සහ මත්ද්‍රව්‍ය මඟින් ඇති වන හානිය අවම කිරීම සඳහා ආයතනය වෙත පැවරී ඇති වගකීම ඉටු කිරීම උදෙසා නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය, පහත සඳහන් අංශ 16 ක් ඔස්සේ දීප ව්‍යාප්තව වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.<br>1. පාසල් සිසුන් සඳහා නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්<br>2. ජාත්‍යන්තර පාසල් සඳහා නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්<br>3. වෘත්තීය පුහුණු හා තෘතීයික අධ්‍යාපන ආයතන වල ශිෂ්‍යාවන් සඳහා වූ නිවාරණ අධ්‍යාපනය ඉහළ නැංවීමේ වැඩසටහන්<br>4. මුල් ළමාවිය සංවර්ධන සහ මත්ද්‍රව්‍ය නිවාරණය උදෙසා දෙමාපිය දැනුවත් කිරීමේ වැඩසටහන්පාසල් සිසුන් සඳහා නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්<br>5. විශ්ව විද්‍යාල සිසුන් ගේ මත්ද්‍රව්‍ය අධ්‍යාපනය ඉහළ නැංවීමේ වැඩසටහන්<br>6. දහම්පාසල් දරුවන් හා ගුරුවරුන් සඳහා වන මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්<br>7. රාජ්‍ය නිළධාරීන් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්<br>8. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිළධාරීන් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්<br>9. වතු ආශ්‍රිත ජනතාව උදෙසා මත් නිවාරණ වැඩසටහන්<br>10. නීතිය බලාත්මක කිරීමේ නිළධාරීන් ඉලක්ක කරගනිමින් ක්රියාත්මක කරන ලද වැඩසටහන්<br>11. ප්‍රජාව ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක කරන ලද නිවාරණ වැඩසටහන්<br>12. මහජන ප්‍රදර්ශන<br>13. තරුණ නායකයින් පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීමේ වැඩසටහන් | කාන්තාවන් ඉලක්ක කර ගෙන සිදු කරන ලද නිවාරක අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් සිදු කිරීම. |

14. ගුරුවරුන් මත්ද්‍රව්‍ය නිවාරක පුහුණු කරුවන් ලෙස පුහුණු කිරීමේ වැඩසටහන්
15. විශාල වැඩබිම් තුළ සේවකයින් සඳහා මත්ද්‍රව්‍ය නිවාරක අධ්‍යාපනය
16. පුද්ගල හා කණ්ඩායම් උපදේශනය

එම අංශ16 තුළ වැඩි කාන්තා සහභාගීත්වයක් සහිත අංශ ලෙස දෙමාපියන් සඳහා මුල් ළමා විය සංවර්ධනය පිළිබඳ නිවාරණ වැඩසටහන් ප්‍රජාව සඳහා පවත්වන ලද වැඩසටහන් සහ වැවිළි ක්ෂේත්‍ර යේ නිවාරණ වැඩසටහන් මෙන්ම විශාල වැඩබිම් සඳහා පවත්වන ලද වැඩසටහන් හඳුන්වාදිය හැකිය. ඒ ඔස්සේ මත්ද්‍රව්‍ය භාවිතය, අලෙවිය සහ ජාවාරම සම්බන්ධව කාන්තා දායකත්වය අවම කරගැනීම ආවරණය වන පරිදි කරුණු සාකච්ඡා කරනු ලැබේ. ඊට අමතරව අනිකුත් අංශ ඔස්සේ ද සම්බන්ධ වන කාන්තා ප්‍රජාව අරමුණු කරගනිමින් වැඩසටහන් දියත් කරනු ලැබේ.

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලයට අයත් පිරිවැය රු.4,027,518 ක් වූ හෝමාගම පිහිටි පර්චස් 40 ක ඉඩම 2014 අප්‍රේල් 30, දින 30 අවුරුදු බදු ක්‍රමයට මිලදී ගෙන තිබුණද සමාලෝචිත වර්ෂය දක්වාම වසර 6 ක් තිස්සේ ඵලදායී කාර්යයක යොදා ගැනීමකින් තොරව තවදුරටත් නිශ්කාර්යව පැවැතුණි. | මේ වන විට හෝමාගම පිටිපන ඉඩමේ “National Education and Training Centre on Substance Abuse Management” සෑදීම සඳහා අවශ්‍ය මූලික පියවරයන් ගෙන ඇති අතර, එහිදී ඊට අදාලව පහත කාර්යයන් ඉටු කරනු ලැබේ. | ඉඩම ඵලදායි කාර්යකට යොදා ගැනීමට |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)පිරිවිතර ඇතුළු ලංසු ලේඛන කෙටුම්පත් සකස් කිරීම සහ ඒවා සමාලෝචනය කිරීම ප්‍රසම්පාදන අස්ථිත්වයක වගකීම වුවත් එසේ නොමැතිව ප්‍රසම්පාදන කළමණාකරු විසින් අවශ්‍ය පිරිවිතර තීරණය කර සැපයුම්කරුවන් වෙත පොත් රාක්ක 8ක් හා වානේ කබඩ් 12 ක් මිලදීගැනීම සඳහා මිල කැඳවීම් කර තිබුණි. | ඉදිරියේදී මෙවැනි දෝෂ මග හරවා ගැනීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රසම්පාදන කටයුතු නිවැරදිව ඉටු කිරීමට |
| (ආ)2015 අප්‍රේල් රු.3,884,160 කට මිලදි ගන්නා ලද විඩියෝ පැනලය තාක්ෂණික උපදේශක තහවුරුවක් නොමැතිව ස්ථාපනය කර තිබුණි. විවෘත කල දින සිට මෙම පැනලය වසර 3ක වගකීම් කාලය තුල 6 වරක් දෝෂ සහගත තත්ත්වයක් ඇති වී ක්‍රියා විරහිත වී තිබුණි. මේ නිසා බලාපොරොත්තු වූ අරමුණු ඉටුනොවී නිශ්කාර්යව පැවතුණි. | LED වීඩියෝ පැනලය සම්බන්ධව LED වීඩියෝ පැනලය සම්බන්ධව කොළඹ විශ්ව විද්‍යාලයේ තොරතුරු පද්ධති කළමණාකරු ඇතුළු තාක්ෂණික ඇගයුම් කමිටුවක් මඟින් පිරිවිතර සකස් කර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියෙන් ප්‍රසම්පාදන කටයුතු සිදුකර එය ස්ථාපනය කර ඇති අතර ස්ථාපනය කිරීමෙන් පසුව ද කොළඹ විශ්ව විද්‍යාලයේ තොරතුරු පද්ධති කළමණාකරු විසින් වීඩියෝ පැනලය පරික්ෂා කර නිර්දේශ කර ඇත. මේ සඳහා වසර 3ක වගකීම් කාලයක් පැවති අතර එම කාලය තුළ දෝෂ සහිත වූ අවස්ථාවල එම ආයතනය විසින් ගාස්තු අයකිරීමකින් තොරව එම අළුත්වැඩියා සිදුකරන ලදි. ගිවිසුම්කල කාලයේ පසුව ඇතිවූ දෝෂ ගිවිසුම් ගත නොවීම නිසා අළුත්වැඩියා නොකරන ලදි5<br><br>මේ වන විට මෙම LED වීඩියෝ පැනලය ක්‍රියාත්මක නොවන හෙයින් මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණික වාර්තාවක් ඉල්ලා ඇති අතර එම වාර්තාව විද්‍යුත් පණිවුඩයක් මඟින් එවා ඇත. මෙහි මුල්පිටපත ඉල්ලා සිහිකැඳවීමේ ලිපියක් 2020.06.11 වන දින යොමු කර ඇත. තාක්ෂණික නිළධාරින්ගෙන් සැදුම්ලත් කමිටුවක් මඟින් මේ සම්බන්ධව තීරණයක් ගෙන ඉදිරිකටයුතු කිරීමට පියවර ගෙන ඇත. | බලාපොරොත්තු වූ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කිරීම |

| | | |
|---|---|---|
| (ඇ) 2016 වර්ෂයේ රු.3,254,469 ක මුදලක් වියදම් කර මහනුවර හා නවදිගන්තය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත අකුණු සන්නායක පද්ධතියක් සවිකර තිබූ අතර එය නිසියාකාරව ක්‍රියාත්මක නොවී පැවතුණි. එම නිසා අකුණු සැර වැදීමකින් මධ්‍යස්ථානයේ උපකරණඅක්‍රීය වී තිබූ අතර අකුණු සන්නායක පද්ධතිය සවිකිරීමේ අරමුණ ඉටු නොවී පැවතුණි. | අදාල පෞද්ගලික ආයතනයේ නිලධාරියෙකු යවා අවශ්‍ය පියවර ගන්නා බව. | නිවැරදි පිරිවිතරයන්ට අනුව මිලදී ගැනීම් සිදු කිරීමට |
| (ඈ) ජාතික මාදක රසායනාගාරයට Narcotic Trace Detector යන්ත්‍රයක් රු.3,625,360 කට මිලදී ගෙන ඒ සඳහා අවශ්‍ය කාමර උෂ්ණත්වය, Humidity Level සකස්කර නොතිබීම හේතුවෙන් ක්‍රියාත්මක කරවීමට නොහැකිව අසුරා තිබුණි. | මෙම යන්ත්‍රය ස්ථාපිත කිරීමේදී කාමර උෂ්ණත්වය පිළිබඳ කිසිදු සඳහනක් නොවූ බැවින් ප්‍රසම්පාදන කටයුතු සිදු නොවිය. 2020 වර්ෂයේදී කටයුතු කරනු ලැබේ. | යන්ත්‍රය මණ්ඩලයේ කාර්යභාරය ඉටුකර ගැනීමට යොදා ගැනීම |

**3.7 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සහකාර උපදේශන නිලධාරී තනතුරු 8 ක් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන 98/2017 දරණ මණ්ඩලීය අනුමැතිය මත පමණක් පුරප්පාඩු පුරවා තිබුණි. | ඉදිරියේදී මෙවැනි දෝෂ සිදු නොවන ආකාරයට කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | නිලධාරීන් බඳවා ගැනීමේදී පූර්ව අනුමැතිය ලබා ගැනීමට |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අභ්‍යන්තර විගණන සැලැස්ම ප්‍රධාන කාර්යයන් 7ක් යටතේ සැලසුම් කර තිබුණද ඉන් කාර්යයන් දෙකක් පමණක් ඉටුකර තිබුණි. එනම් මුදල් රෙගුලාසි 134(3) අනුව කටයුතු කර නොතිබුණි. මීට අමතරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බාහිර සේවා අංශ විගණන කටයුතුද ඇතුලත් කිරීමට යටත්ව එම සැලැස්ම අනුමත කර තිබූ අතර එයද ඉටුකළ බවට සාක්ෂි නොතිබුණි. එසේම 2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අභ්‍යන්තර විගණක සහ සහාය කාර්ය මණ්ඩලය වෙනුවෙන් රු.1,214,550 ක වැටුප් හා දීමනා ගෙවීමෙන් මණ්ඩලයට ඵලදායි කාර්යයන් ඉටුවී නොතිබුණි. | 2019 විගණන සැලැස්මට අනුව එහි අනුක්‍රමික අංක 02,06 සහ 07 හි සඳහන් විගණන කටයුතු නිම කිරීම පසුගිය දින වල පැවති කොවිඩ් -19 වසංගත තත්ත්වය හමුවේ නොහැකි වූ බවත්, විගණන සැලසුමට අනුව අනුක්‍රමික අංක 01 සහ 05 හි කරුණු 2019 මැයි මස සිට 2019 දෙසැම්බර් මස දක්වාත් පොදු ව්‍යාපාර පිලිබඳ කාරක සභාවේ වාර්තා සැකසීමට සිදු වූ බැවින් එම විගණනයන් සිදු කර ගත නොහැකි වූ බවත් ඉදිරියේදි මේ වන තෙක් ඉදිරිපත් නොවුන විගණන විමසුම් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | අභ්‍යන්තර විගණනයෙන් ඉහළ කාර්ය සාධනයක් ඉටු කිරීමට |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් හා සත්‍ය වියදම් සමඟ සැසඳීමේදී වැය විෂයයන් 18 කට අදාලව සියයට -260 සිට සියයට 51 ක් දක්වා වූ විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛණය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේදී අයවැයගත වියදම් සහ සත්‍ය වියදම් අතර වැය විෂය 10ට අදාළ විචලනයන් විගණනය විසින් නිරීක්ෂණය කර ඇත. එහිදි ඇතැම් වියදම් ඇස්තමේන්තුගත මුදලට වඩා අඩු සත්‍ය වියදමක් පෙන්වන්නේ 2019 වර්ෂයේ මුල් භාගයේ රටේ ඇති වූ අයහපත් සිවිල් තත්වය මත බලාපොරොත්තු වූ වියදම් උද්ගත නොවීමයි.<br><br>අනෙක් අතට ඇතැම් වියදම් ඇස්තමේන්තුගත මුදලට වඩා වැඩි සත්‍ය වියදමක් පෙන්වන්නේ 2019 වර්ෂය තුළ ප්‍රතිපත්ති වෙනස් වීම මත හා කළමනාකරණ තීරණ මත යම් විචලනයන් සිදු වීමයි. උදා. ලෙස කළමනාකරණ තීරණ මත අතිකාල දීමනා ඉහළ දැමීම සහ තලංගම මධ්‍යස්ථානය වෙත රාත්‍රි කාලය සඳහා කාන්තා ආරක්ෂක සේවාවක් ස්ථාපිත කිරීමයි. | අයවැය ලේඛණය නිවැරදිව සකස් කිරීමට |